| | | |
|---|---|---|
| | I පත්‍රය | |
| | II පත්‍රය | |
| | එකතුව | |

# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2013

## බුද්ධ ධර්මය

## 7 ශ්‍රේණිය

කාලය - පැය 2 යි

නම: ............................................ පංතිය: ............................................

### I කොටස

නිවැරදි පිළිතුරේ අංකය වරහන තුළ ලියන්න.

(1) බෞද්ධයාගේ නිත්‍ය සීලය
(i) පංච සීලයයි
(ii) දස සීලයයි
(iii) අජීව අෂ්ටමක සීලයයි
(iv) අට සීලයයි ( )

(2) පැරණි ධර්ම සාලාවල සිවු දිගට දොරවල් සතරක් ඇත්තේ
(i) සිවු දෙසින් එන සැමට එක්ව පින් දහම් කිරීමටයි
(ii) සතර දිසා වලට ගරු කිරීම සඳහාය
(iii) සතර වරම් දෙවි වරුන්ට ගරු කිරීම සඳහාය
(iv) සතර දෙසින් වඩින මහා සංඝරත්නය උදෙසාය ( )

(3) විශාඛාව
(i) බරණැස් සිටුතුමාගේ මිණිබිරියයි
(ii) අනාථ පිණ්ඩික සිටුතුමාගේ මිණිබිරියයි
(iii) මිගාර සිටුතුමාගේ මිණිබිරියයි
(iv) මෙණ්ඩක සිටුතුමාගේ මිණිබිරියයි ( )

(4) "ලස්සනට ඇඳ පැළඳ ගත් කාන්තාවක් මහ මඟ දුවන එක අශෝභනයි" මෙය,
(i) විශාඛාවගේ ප්‍රකාශයකි
(ii) මෙණ්ඩක සිටුතුමාගේප්‍රකාශයකි
(iii) සුමනා දේවියගේ ප්‍රකාශයකි
(iv) ශාක්‍ය කුමාරිකාවන්ගේ ප්‍රකාශයකි ( )

(5) මිගාර මාතු පාසාදය යනු
(i) ජේතවනාරාමයයි
(ii) නිග්‍රෝධාරාමයයි
(iii) පූර්වාරාමයයි
(iv) වේළුවනාරාමයයි ( )

(6) සත් හට වන භව දුකට වෙදාණන් යන්නෙහි අදහස
(i) සැම රෝගයක් සඳහාම ප්‍රතිකාරයක් ඇති බවය
(ii) බුදුරජාණන් වහන්සේ රෝග වලට ඖෂධ නියම කළ බවයි
(iii) බුදුරජාණන් වහන්සේ රෝග නිධානය ප්‍රකාශ කළ බවයි
(iv) බුදුරජාණන් වහන්සේ සත්ත්වයාගේ භව නමැති දුකට වෛද්‍යවරයෙකු බවයි ( )

(7) ත්‍රිකෝටික පාරිශුද්ධ සීලය උගන්වන්නේ
(i) මංගල සූත්‍රයේදීය
(iii) පරාභව සූත්‍රයේදීය

(ii) කාලාම සූත්‍රයේදීය (iv) ධම්මික සූත්‍රයේදීය ( )

(8) "මහණෙනි තථාගතයන්ට නාමයෙන් ද ආවුසොයි කියාද කතා නොකරව්.මහණෙනි! තථාගත තෙමේ රහත්ය.සම්මා සම්බුද්ධය" මෙය,

(i) චූල්ල වග්ග පාලියේ සඳහන් වන්නකි
(ii) මහා වග්ග පාලියේ සඳහන් වන්නකි
(iii) පාරාජිකා පාලියේ සඳහන් වන්නකි
(iv) පාචිත්තිය පාලියේ සඳහන් වන්නකි ( )

(9) බුදුරජාණන් වහන්සේ නිශ්ශබ්දතාවය අගය කළ බවට නිදසුන් සැපයිය හැකි සූත්‍රයකි,

(i) සංයුක්ත නිකායේ ආයු සූත්‍රය
(ii) දීඝ නිකායේ රාහුලෝවාද සූත්‍රය
(iii) දීඝ නිකායේ පොට්ඨපාද සූත්‍රය
(iv) මජ්ඣිම නිකායේ සේල සූත්‍රය ( )

(10) ලක්දිව භික්ෂුණී ශාසනය ඇතිවූයේ,

(i) සෝමා දේවිය ඇතුළු පිරිස පැවිදි කිරීමෙනි
(ii) භද්දකච්චායනා කුමරිය ඇතුළු පිරිස පැවිදි කිරීමෙනි
(iii) විහාර මහා දේවිය ඇතුළු පිරිස පැවිදි කිරීමෙනි
(iv) අනුලා දේවිය ඇතුළු පිරිස පැවිදි කිරීමෙනි ( )

(11) පැරණි ආරාමික අධ්‍යාපන ආයතනයක් නොවන්නේ

(i) මහනුවර දළදා මාළිගාව
(ii) අනුරාධපුර මහා විහාරය
(iii) අනුරාධපුර අභයගිරි විහාරය
(iv) අනුරාධපුර ජේතවන විහාරය ( )

(12) ලෙන් විහාර බෞද්ධ චිත්‍ර වලට නිදසුනකි,

(i) දඹුලු විහාරය
(ii) දඹදෙණි විහාරය
(iii) සිතුල්පව්ව විහාරය
(iv) ගඩලාදෙණි විහාරය ( )

(13) සිංහල අක්ෂර මාලාව සකස් වූයේ,

(i) පැරණි සාහිත්‍ය පොත් වල අක්ෂර මාලාවට අනුවය
(ii) සිදත් සඟරාවේ අක්ෂර වලට අනුවය
(iii) පැරණි ව්‍යාකරණ ශාස්ත්‍රයේ අක්ෂර වලට අනුවය
(iv) භාරතයේ බ්‍රාහ්මී අක්ෂර වලට අනුවය ( )

(14) සිඟාලෝවාද සූත්‍රය අනුව පුද්ගලයා උපයන ධනය පරිභෝගයේදී කොටස්,

(i) තුනකටය
(ii) පහකටය
(iii) හයකටය
(iv) හතරකටය

බෙදාගත යුතුය ( )

(15) තුලධාරිත පුද්ගලයා යනු,

(i) අයවැය සමසේ පවත්වාගන්නා පුද්ගලයාය
(ii) ආදායමට වඩා වියදම් කරන පුද්ගලයාය
(iii) තමාට ලැබෙන සියලු මුදල් වියදම් කරන පුද්ගලයාය
(iv) අදායම,වියදම සමව පවත්වා ගත නොහැකි පුද්ගලයාය ( )

(16) බුදුරජාණන් වහන්සේගේ ඉවසීමේ ගුණයට නිදසුනකි,

(i) ක්ෂාන්තිවාදී ජාතකය
(ii) සාම ජාතකය
(iii) වෙස්සන්තර ජාතකය
(iv) සුතසෝම ජාතකය ( )

(17) සමුක්කංසික දේශනාව යනු,

(i) චතුරාර්ය සත්‍ය දේශනාවයි (iii) සාමූහිකව දේශනා කිරීමයි

(ii) ත්‍රිපිටක දේශනාවයි (iv) නිවන පිළිබඳ දේශනාවයි ( )

(18) නිවත්තක යනුවෙන් හැඳින්වෙන්නේ,

(i) ආර්ය අෂ්ටාංගික මාර්ගයයි (iii) තිපරිවට්ටයයි

(ii) දුක නැති කිරීම හෙවත් නිවනයි (iv) කෘත ඥානයයි ( )

(19) ධම්ම චක්කප්පවත්තන යනු,

(i) ධර්මය චක්‍රාකාරයෙන් දේශනා කිරීමයි

(ii) ධර්මයේ සත්‍ය කොටස් පමණක් දේශනා කිරීමයි

(iii) චක්‍රයක් උපමාවට ගෙන දහම් දෙසීමයි

(iv) ධර්මය හා චක්‍රය අතර වෙනස පැහැදිලි කිරීමයි ( )

(20) අප දිනපතා පිළිපැදිය යුතු සිරිත් උගන්වන කෘතියකි,

(i) ලෝවැඩ සඟරාව (iii) සුභාෂිතය

(ii) බුදුගුණ අලංකාරය (iv) සිරිත් මල්දම ( )

(ලකුණු=2x20=40)

## II කොටස

(1) පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

i) සහජීවනය යන්නෙහි අදහස කෙටියෙන් ලියන්න.

ii) විශාඛාවගේ චරිතයෙන් තරුණියකට ගතහැකි ආදර්ශ දෙකක් ලියන්න.

iii) විරමනය සහ සමාදානය යන අංග දෙක කෙටියෙන් හඳුන්වන්න.

iv) ඔබ දන්නා ශාසනික ව්‍යවහාර හතරක් ලියා දක්වන්න.

v) ජාතක කතා කවියෙන් ලියැවුණු සිංහල සාහිත්‍ය ග්‍රන්ථ දෙකක නම් ලියන්න.

vi) 'එකෙන භෝගේ භුඤ්ජෙය්‍ය....' යන ගථාව සම්පූර්ණ කර ලියන්න.

vii) 'මාරාතිරේක මහියුජ්ඣික සබ්බ රත්තිං...' යන ගථාවේ තේරුම ලියන්න.

viii) බුදුරජාණන් වහන්සේගේ ඉවසීමේ ගුණය ප්‍රකට වන අවස්ථා දෙකක් ලියා දක්වන්න.

(ලකුණු=2X8=16)

(2)

i) විශාඛා මහා උපාසිකාවගේ මව්පියන්ගේ නම් ලියා දක්වන්න. (ලකුණු=2)

ii) විශාඛාවට පියාගෙන් ලැබුණු අවවාද හතරක් ලියා දක්වන්න. (ලකුණු=4)

iii) එහි සරල අදහස ලියා දක්වන්න. (ලකුණු=5)

(3)

i) බුදුරජාණන් වහන්සේ අන්‍යාගමිකයන් හා සහජීවනයෙන් ක්‍රියා කළ අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු=2)

ii) ගැමියන් සහජීවනයෙන් කටයුතු කරනු දැකිය හැකි අවස්ථා හතරක් ලියන්න. (ලකුණු=4)

iii) අන්‍ය ආගමිකයන් හා ජාතීන් සමඟ සුහදව ජීවත් වීමට ඔබ අනුගමනය කරන පිළිවෙත් පහක් ලියන්න. (ලකුණු=5)

(4)

i) ත්‍රිකෝටික පාරිශුද්ධ සීලය නම් කරන්න. (ලකුණු=2)

ii) සීලයෙහි චාරිත්‍ර සහ වාරිත්‍ර යන අංග දෙක කෙටියෙන් පහදන්න (ලකුණු=4)

iii) යහළුවන් පවෙන් වළක්වා යහපතෙහි යෙදවීමට ඔබට අනුගමනය කල හැකි ක්‍රියාමාර්ග 5ක් ලියන්න. (ලකුණු=5)

(5)

i) උදේනි රජතුමා හා ආනන්ද හිමියන් අතර ඇතිවූ සංවාදයෙන් අපට ගතහැකි ආදර්ශ දෙකක් ලියන්න. (ලකුණු=2)

ii) සිඟාලෝවාද සූත්‍රයට අනුව උපයන ධනය පරිභෝග කළයුත්තේ කෙසේද? (ලකුණු=4)

iii) ඔබේ අධ්‍යාපනික උපකරණ භාවිතයේදී හා නඩත්තුවේදී ඔබ සැලකිල්ලට ගතයුතු කරුණු හතරක් ලියා දක්වන්න. (ලකුණු=5)

(6)

i) ඉවසීමෙන් තොර පුද්ගලයාට මුහුණ පෑමට සිදුවන ගැටළු දෙකක් ලියන්න. (ලකුණු=2)

ii) ඉවසීමේ අගය ප්‍රකාශ කෙරෙන ආදර්ශ පාඨ හතරක් ලියා දක්වන්න. (ලකුණු=4)

iii) ඉවසීම ප්‍රගුණ කිරීමෙන් ඔබට ලද හැකි ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු=5)

(7)

i) සිරිත් විරිත් යන වචන දෙකේ තේරුම ලියන්න. (ලකුණු=2)

ii) "පෙකණිය නොදක්වා....." යනාදී කවිය සම්පූර්ණ කර ලියන්න. (ලකුණු=4)

iii) ඔබට අනුගමනය කළ හැකි හොඳ සිරිත් පහක් ලියන්න. (ලකුණු=5)